කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010

2012 ජනවාරි

BMGT E 1045 – ව්‍යාපාර නීතිය

ප්‍රශ්න සංඛ්‍යාව : 07

| විභාග අංකය- |
|---|

කාලය : පැය 03 යි

උපදෙස්

ඔබ විසින් පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුය. පළමු ප්‍රශ්නය සඳහා පිළිතුරු, ප්‍රශ්න පත්‍රයෙහිම සැපයීම අනිවාර්ය වන අතර එය අනෙකුත් පිළිතුරු ඇතුලත් පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතුය.

I කොටස

(01) (අ) පහත සඳහන් එක් එක් ප්‍රශ්නය සඳහා වූ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(I) පහත සඳහන් ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය කුමක්ද?

අ) නීතිය ඉදිරියේ බලාත්මක කළ හැකි එකඟතාවයක් ගිවිසුමකි.

ආ) සෑම එකඟතාවයක්ම ගිවිසුමකි.

ඇ) සෑම ගිවිසුමක්ම එකඟතාවයකි.

ඈ) නීතියෙන් බැඳීමේ චේතනාවෙන් තොර එකඟත්වයක් ගිවිසුමක් නොවේ.

(II) පහත සඳහන් ඒවා අතුරින් වලංගු ප්‍රතිග්‍රහනයක් උදෙසා තිබිය යුතු නීතිමය අවශ්‍යතාවයක් නොවන්නේ,

අ) එය සන්නිවේදනය විය යුතුය.

ආ) එය නිශ්චිත සහ කොන්දේසි විරහිත විය යුතුය.

ඇ) නිශ්චිත කාලසීමාවක් තුළ සන්නිවේදනය නොකළේ නම් එය නිශ්ශබ්දතාවය තුලින් ඇතිවේ.

ඈ) එය ප්‍රතිග්‍රහනය කිරීමට බලය ඇති තැනැත්තාට ප්‍රතිග්‍රහනය කළ හැක.

(III) ගිවිසුමක් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු දිනට පෙර පොරොන්දුකරු විසින් නිශ්චිත වශයෙන් ගිවිසුම්ගත වගකීම් ඉටු නොකරන බැව් දැනුම් දීම හැඳින්වෙනුයේ,

අ) ගිවිසුම අත්හැරීම.

ආ) සත්‍ය ගිවිසුම් කඩ කිරීම.

ඇ) පූර්ව ගිවිසුම් කඩ කිරීම.

ඈ) ගිවිසුම ව්‍යාර්ථ වීම.

(IV) ඇතැම් විට පාර්ශවයන් විසින් ඉටු කරන ලද කාර්ය ප්‍රමාණය උදෙසා වන්දි ලබා ගත හැක. එය කළ හැක්කේ,

අ) අලාභ ලබා ගැනීමට.

ආ) තහනම් ආඥාවක් ලබා ගැනීමට.

ඇ) ප්‍රමාණාත්මක ගෙවීමක් ලබා ගැනීමට.

ඈ) ගිවිසුම නිසි පරිදි ඉටු කරවාගැනීමට නඩු පැවරීමෙනි.

(V) හානි උදෙසා වන්දි ගෙවීම සම්බන්ධයෙන් අදාල වන වැදගත් ඉංග්‍රීසි නඩුවක් වන්නේ,

අ) හැඩ්ලි ඒ. බැක්සැන්ඩේල්

ආ) හැඩ්ලි ඒ. සලිවියන්

ඇ) හොබ්ස් ඒ. ලන්ඩන් රේල්වේ සමාගම

ඈ) කාටර් ඒ. සලිවියන්

(VI) පහත සඳහන් ඒවා අතුරින් වලංගු නියෝජ්‍යත්වය උදෙසා අවශ්‍ය නොවන මූලිකාංගයක් වන්නේ,

අ) ප්‍රධානියාට ගිවිසුම් වලට එළඹීමට හැකියාව තිබිය යුතුය.

ආ) නියෝජිතයාට ගිවිසුම් වලට එළඹීමට හැකියාව තිබිය යුතුය.

ඇ) නියෝජිතයා නියෝජනය කරන තත්ත්වයෙන් කටයුතු කළ යුතුය.

ඈ) ප්‍රකාශිත හෝ ව්‍යාංග එකඟත්වයක් තිබිය යුතුය.

(VII) නිශ්චිත නොවන භාණ්ඩ සම්බන්ධයෙන් වූ විට අයිතිය ගැනුම්කරු වෙත මාරු වන්නේ භාණ්ඩ,

අ) නිශ්චිතව හඳුනාගත් විටදිය.

ආ) ගිවිසුම උදෙසා වෙන් කළ විටදීය.

ඇ) නියමිත පරිදි කිරීම් සහ මැනීම් කළ විටදීය.

ඈ) ඉහත සඳහන් (අ) සහ (ආ)

(VIII) පහත සඳහන් ඒවා අතුරින් හවුල්කරුවෙකු සතු අයිතියක් නොවන්නේ,

අ) ව්‍යාපාර කටයුතු වලට සම්බන්ධ වීමෙහි අයිතිය.

ආ) ගිණුම් පොත්පත් පරීක්ෂා කර බැලීමේ අයිතිය.

ඇ) ලාභ බෙදා ගැනීමට ඇති අයිතිය.

ඈ) වැටුපක් ලබාගැනීටම ඇති අයිතිය.

(IX) යමෙකු සද්භාවයෙන් අගනා ප්‍රතිෂ්ඨාවක් ගෙවා ගණුදෙනු කළ හැකි ලියවිල්ලක් ලබා ගතහොත් ඔහු නෛතික වශයෙන් හැඳින්වෙන්නේ,

අ) දරන්නා

ආ) අගයට දරන්නා

ඇ) යථා කාල ධාරකයා

ඈ) අණලාභී

(X) පහත සඳහන් වෘත්තීය සමිති ක්‍රියා මාර්ග අතුරින් කුමක් නීති විරෝධී වන්නේද?

අ) අකුරට වැඩ කිරීම.

ආ) පිකටි කිරීම.

ඇ) වැඩ වර්ජනය කිරීම.

ඈ) දොර වැසීම.

(ආ) පහත ප්‍රකාශ "නිවැරදිද", "වැරදිද" යන්න සඳහන් කරන්න.

(I) යම් ගිවිසුමක් ලිඛිතව හෝ ප්‍රකාශිතව නොසැදුවත් ගිවිසුමකට අදාල අනෙකුත් කොන්දේසි සපුරාලන්නේ නම් ව්‍යාංග ගිවිසුමක් පවා වලංගු වේ.

.....................................................................................................................................

.....................................................................................................................................

(II) ප්‍රතිෂ්ඨාව ප්‍රමාණවත්ද යන්න වැදගත් නොවේ. නමුත් ප්‍රතිෂ්ඨාවක් රහිත එකඟත්වයක් හිස්වේ.

.....................................................................................................................................

.....................................................................................................................................

(III) අවනිදේශනය යටතේ හිංසාවට පත් පාර්ශ්වයට එක්කෝ ගිවිසුම අවලංගු කළ හැක. නැතිනම් අනුමත කළ හැක.

.....................................................................................................................................

.....................................................................................................................................

(IV) නියෝජිතයකු යනු තුදෙක් ප්‍රධානියෙකු සහ තෙවන පාර්ශවයක් සම්බන්ධ කරන්නෙකු වන අතර ඔහු පෞද්ගලිකව වගකීම් නොදරයි.

.....................................................................................................................................

.....................................................................................................................................

(V) භාණ්ඩ විකිණීමේ ගිවිසුමකට සැමවිටම ව්‍යාංග කොන්දේසි ගණනාවක් අදාල වන අතර ඒවා ප්‍රතිඥාභාර වශයෙන්ද සැලකිය හැක.

.....................................................................................................................................

.....................................................................................................................................

(VI) කාලය ඉකුත් වීමෙන් හෝ අදාල කොන්දේසි සම්පූර්ණ වීමෙන් විකිණීමට එකඟත්වයත්, විකිණීමක් බවට පත්වේ.

.....................................................................................................................................

.....................................................................................................................................

(VII) බාල වයස්කරුවෙකුට ගණුදෙනු කළ හැකි ලියවිල්ලක් සෑදීම, පිටසන් කිරීම හෝ ගණුදෙනු කිරීම කළ නොහැක.

.....................................................................................................................................

.....................................................................................................................................

(VIII) හවුල් ව්‍යාපාරයේ පාඩු සම සමව දරා ගැනීම සෑම හවුල්කරුවෙකුගේම යුතුකමකි.

.....................................................................................................................................

.....................................................................................................................................

(IX) විනිමය බිල්පත්‍රයක් අණලාභී විසින් ප්‍රතිග්‍රහණය නොකිරීම නිසා අගරු වේ.

.....................................................................................................................................

.....................................................................................................................................

(X) සාංගමික ව්‍යවස්ථාවලිය යනු සමාගම සහ එහි කොටස් හිමියන් අතර ඇති එකඟත්වයකි.

.....................................................................................................................................

.....................................................................................................................................

(ලකුණු 2 x 10)

(02) අ) (i) අර්පණය යන්න නිර්වචනය කරන්න.

(ii) අර්පණයක් අවසාන වන ක්‍රම මොනවාදැයි විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

ආ) වාහනයක් රු. මිලියනයකට විකිණීම පිණිස ඇල්ෆා සමාගම විසින් බීටා සමාගම වෙත 2011 නොවැම්බර් මස 15 දින ලිපියක් මගින් අර්පණයක් ඉදිරිපත් කරන ලදී. එම ලිපියෙහි තවදුරටත් දක්වා තිබුනේ මෙම අර්පණයට අදාල ප්‍රතිග්‍රහණය ලිඛිතව 2011 දෙසැම්බර් 31 දින වන විට සමාගමේ සාමාන්‍යාධිකාරී වෙත ලැබිය යුතු බවයි. බීටා සමාගම අර්පණය ප්‍රතිග්‍රහනය කළ අතර අදාල ලිපිය 2011 දෙසැම්බර් 26 දින තැපැල් කරන ලදී. ඊට අමතරව බීටා සමාගමේ සාමාන්‍යාධිකාරී දුරකථනයෙන් ඇල්ෆා සමාගම අමතා තමාට සාමාන්‍යාධිකාරීට කථා කිරීටම අවශ්‍ය බැව් දන්වීය. නමුත් එම අවස්ථාවේ ඔහු කාර්යාලයේ නොසිටි අතර එහි සිටි ඔහුගේ පෞද්ගලික ලේකම් වෙත අදාල අර්පනය ප්‍රතිග්‍රහණය කිරීම පිළිබඳව දැනුම් දුන්නේය. ඇල්ෆා සමාගමේ සාමාන්‍යාධිකාරී වෙත ප්‍රතිග්‍රහණය සහිත ලිපිය තවමත් ලැබී නැති බැව් බීටා සමාගමට දැනගැනීමට ලැබුණි. එසේම අදාල දුරකථන පණිවිඩය පිළිබඳව අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දීමට පෞද්ගලික ලේකම්ට අමතක වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස අදාල වාහනය ගැමා සමාගම වෙත විකුණන ලදී. ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් ඇල්ෆා සමාගම වගකීමෙන් බැදේද?

(ලකුණු 08)

(03) අ) සමන්ති පරිගණකයක් කම්පියුටර් වර්ල්ඩ් සමාගමෙන් මිලදී ගත්තාය. ඇය එම පරිගණකය අදාල ආයතනයෙන් මිලදී ගන්නා අවස්ථාවේදී එහි සිටි වෙළඳ සේවකයාට පැහැදිලිව ප්‍රකාශ කර සිටියේ සිය කටයුතු කරගෙනයාම සඳහා අවම වශයෙන් 4 GB ධාරිතාවයකින් යුත් පරිගණකයක් ඇයට අවශ්‍ය බවයි. නමුත් පසුව ඇයට දැනගැනීමට ලැබුනේ මිලදී ගත් පරිගණකයේ ධාරිතාවය 1GB බවයි. සමාගමට එරෙහිව අදාල පරිගණකය මිලදී ගැනීමේ පරමාර්ථයට සුදුසු නොවීම සහ වෙළඳ තත්වය නොපැවතීම යන කරුණු මත නඩු පැවරීමට සමන්තිට අවශ්‍යව ඇත. ඇයට මේ සම්බන්ධයෙන් උපදෙස් දෙන්න.

(ලකුණු 08)

ආ) පහත අවස්ථාවන්හිදී භාණ්ඩ වල අයිතිය මාරු වීමට අදාල වන රීති මොනවාද?

(i) භාණ්ඩ නිශ්චිත වන විට

(ii) භාණ්ඩ නිශ්චිත නොවන විට

(iii) භාණ්ඩ "විකිණීම හෝ ආපසු එවීමේ" පදනම මත යවන විට.

(ලකුණු 12)

(04) අ) අපරානුමැතිය මත ඇති වන්නා වූ නියෝජ්‍යත්වය යනු කුමක්ද? වලංගු අපරානුමැතියක් සඳහා අවශ්‍යතාවයන් මොනවාදැයි දක්වන්න.

(ලකුණු 10)

ආ) නියෝජිතයෙකු තෙවන පාර්ශ්වයක් සමඟ එළඹෙන්නා වූ පහත සඳහන් ගිවිසුම වල ප්‍රතිඵල කවරේදැයි විස්තර කරන්න.

(i) ප්‍රධානියෙකු වෙනුවෙන් තමා කටයුතු කරන බව නියෝජිත හෙළි දරව් නොකරන විට

(ii) ප්‍රධානියෙකු වෙනුවෙන් තම කටයුතු කරන බැව් නියෝජිත හෙළිදරව් කරයි. නමුත් සිය ප්‍රධානියාගේ නම හෙළි නොකරයි.

(iii) ප්‍රධානියෙකු වෙනුවෙන් තමා කටයුතු කරන බවත් සිය ප්‍රධානියාගේ නමත් නියෝජිත හෙළිදරව් කරන විට

(ලකුණු 10)

(05) අ) අමල්, බිමල් සහ කැලුම් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෝ වෙති. හවුල් ව්‍යාපාරය මගින් එහි තරඟකරුවන්ගේ ව්‍යාපාර ගිවිසුම් පිළිබඳව තොරතුරු නීත්‍යානුකූල මාර්ගයෙන් ලබා ගැනීම පිණිස අමල්ව පත් කළේය. අමල් තරඟකාරී හවුල් ව්‍යාපාරයක් පිළිබඳව රහස්‍ය තොරතුරු ලබා ගැනීම පිණිස එම ආයතනයේ ලිපිකරුවෙක් වෙත අල්ලස් ලබා දුන්නේය. අල්ලස් ගෙවීම සඳහා වූ මුදල හවුල් ව්‍යාපාරික ආයතනය ආපසු අමල්ට ලබා දෙන ලදී. අල්ලස් මුදල ව්‍යාපාරයට අයත් මුදලින් ලබා දුන් අතර එම තොරතුරු මගින් ලද ලාභ ව්‍යාපාරයේ වත්කම් වලට එකතු විය. දැන් තරඟකාරී ව්‍යාපාරය මේ පිළිබඳව කැලුම්ට එරෙහිව නඩු පැවරීමට අදහස් කරයි.
සිය සම හවුල්කරුවෙකු වූ අමල්ගේ ක්‍රියාව සම්බන්ධයෙන් බිමල් සහ කැලුම් වගකීමට ලක් වේදැයි විනිශ්චිත නඩු තීන්දු යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

ආ) හවුල්කරුවෙකුව හවුල් ව්‍යාපාරයෙන් නෙරපා දැමීමේ බලය හවුල් ව්‍යාපාරය විසින් ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(06) අ) මෑතකදී විනිශ්චය කරන ලද නඩු තීන්දුවල දක්වා ඇත්තේ නිර්නායකයක් වශයෙන් "වැඩ කරන ආකාරය පාලනය කිරීම" යොදාගැනීම මගින් පමණක් යම් ගිවිසුමක් සේවා ගිවිසුමක්ද නැතහොත් සේවය සැපයීම සඳහා වූ ගිවිසුමක්ද යන්න තීරණය කළ නොහැකි බවයි. සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

ආ) ශ්‍රී ලංකාවේ ඇති විවිධ වූ රැකියා ගිවිසුම් මොනවාදැයි නම් කොට සුදුසු උදාහරණ සහිතව ඒවා පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(07) (අ) (i) "වෘත්තිය සමිතිය" යන පදය පැහැදිලි කරන්න.

(ii) වෘත්තිය සමිතියක ප්‍රධාන අරමුණු මොනවාද?

(iii) වෘත්තිය සමිතියක අයිතිවාසිකම් සහ වගකීම් මොනවාදැයි විස්තර කරන්න.

(ලකුණු 08)

(ආ) අරලිය ගාමන්ට් (පෞද්ගලික) සමාගමෙහි ගබඩා භාරකරුවකු වශයෙන් සේවය කළ නිමල් පෙරේරා මහතා ඔහුගේ ගැටළුව පහත දැක්වෙන පරිදි විස්තර කරමින් ඔහුගේ සේවය නතර කිරීම මත සමාගම විසින් ගෙවන ලද පාරිතෝෂිකය සම්බන්ධයෙන් ඔබගෙන් උපදෙස් පතයි.

මම ඉහත සඳහන් ආයතනය යටතේ ගබඩා භාරකරුවෙකු ලෙස 2011 අගෝස්තු 31 දින තෙක් සේවය කළෙමි. ඒ දක්වා මම අවුරුදු 12 ක් සහ දින 301 ක් වූ සේවා කාලයක් සම්පූර්ණ කොට ඇත.

2011 අගෝස්තු මාසය උදෙසා මාගේ වැටුප වූයේ රු. 30,000/= මුදලකි. නමුත් 2010 සැප්තැම්බර් 01 සිට 2011 අගෝස්තු 31 දක්වා මා වැඩ තහනමකට ලක්ව සිටි අතර එම වකවානුවේදී මාගේ මාසික වැටුප වූයේ වැටුපෙන් හරි අඩක් වූ රු. 15,000/= මුදලකි. නමුත් එම වකවානුව තුල කිසිඳු දීමනාවක් මා වෙත ගෙව්වේ නැත. වැඩ තහනම් කිරීමට පෙර රුපියල් 30,000/= ක් වූ මාගේ වැටුපට අමතරව මා වෙත රු. 4,000/= ගමන් වියදම් දීමනාවක්ද, රු. 1,000/= සංග්‍රහ වියදම් දීමනාවක් ද රු. 2,000/= ජීවන වියදම් දීමනාවක්ද තවත් රු. 2,000/= ආහාර වියදම් දීමනාවක්ද වශයෙන් ගෙවන ලදී.

මා වෙත පාරිතෝෂික ගෙවීම පිණිස අදාල කරගෙන තිබුනේ මාගේ වැටුප වන රු. 30,000/= පමණි.

(i) නිමල් වෙත අදාල උපදෙස් දෙන්න.

(ii) නිමල් වෙත ලබා දිය යුතු පාරිතෝෂික මුදල ගණනය කරන්න.

(iii) ඉහත සඳහන් කාරණය සම්බන්ධයෙන් නිමල් වෙත ඇති නෛතිකමය ප්‍රතිකර්මය කුමක්ද?

(ලකුණු 12)